ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2088/31 - 2018 සැප්තැම්බර් මස 12 වැනි බදාදා - 2018.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ (සංශෝධිත) දැන්වීම

*මගේ යොමු අංකය* :- 4/1/1/32-E.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :- 4/3/7/2015/HW/ 69.

මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2021/5 හා 2017.05.29 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පනතේ 07 වැනි වගන්තිය යටතේ මූලික පිඹුරු අංක කු 2366 හි කැබලි අංක 29 සම්බන්ධයෙන් දක්වා ඇති විස්තර සඳහන් ඡේදය පමණක් අවලංගු කර පහත දක්වා ඇති පරිදි ආදේශ කරනු ලබන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් දන්වා සිටිනු ලැබේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් අංක 808, වෙහෙරබැන්ද සහ අංක 836, තෙලියාගොන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසවල අම්බලන්පිටිය ගම්වල පිහිටි සර්වේ ජනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක කු 2366 හා 2018.05.28 දරන මූලික පිඹුරේ කැබලි අංක 130 සි 131 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5457 ක් වූ පහත දක්වා ඇති ඉඩම් කැබලි දෙක (02):

01. කැබලි අංක 130

ඉඩමේ නම: කොලපැලැල්ලකන්දවත්ත; ඉඩම් පරිහරණය: වත්ත සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: කුරුණෑගල, කොළඹ පාර, අංක 79/18 හි පදිංචි එච්. පී. එන්. කේ. පතිරණ සහ පී.එස්.බී. මොනරවිල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1029

02. කැබලි අංක 131

ඉඩමේ නම: කොලපැලැල්ලකන්දවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: දිවුලපිටිය, කොළඹ පාර, අංක 115හි පදිංචි එම්. ටී. නුවන් ගීතාල් පෙරේරා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4428

මෙම ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම තමන්ගේ නම් *ගැසට් පත්‍රයේ* පළ වී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම, පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය, එම ඉඩම් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළ හැකි කරුණු පිළිබඳ විස්තරයක් 2018.09.25 දින මගේ කාර්යාලයේ දී මා හමුවී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2018.10.08 දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයකදී තමන් විසින්ම නැතහොත් ලිඛිතව බලය පවරනු ලබන නියෝජිතයෙකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියම කරනු ලබන ස්ථානයකදී පනතේ 09 වැනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ආර්.එම්.එම්.එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල .

2018 සැප්තැම්බර් මස 10 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

09-730

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ (සංශෝධිත) දැන්වීම

*මගේ යොමු අංකය* :- 4/1/1/32-H,147.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :- 4/3/7/2016/HW/ 180.

මා විසින් අංක 2086/5 හා 2018 අගෝස්තු මස 27 වැනි සඳුදා *අතිවිශේෂ* ගැසට් පත්‍රයේ සඳහන් 07 වැනි වගන්තිය යටතේ පල කරන ලද දැන්වීම මෙසේ සංශෝධනය කරනු ලබන බැව් මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි.

අංක 2016/42 හා 2017 අප්‍රේල් මස 27 දිනැති ගැසට් පත්‍රයේ 07 වැනි වගන්තිය යටතේ පල කරන ලද දැන්වීමේ අනු අංක 169 යටතේ සඳහන් කර ඇති කැබලි අංක 169 පිළිබඳ විස්තරය මෙයින් අංවලංගු කර, ඒ වෙනුවට අංක 2086/5 හා 2018 අගෝස්තු මස 27 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* සඳහන් 7 වැනි වගන්තිය යටතේ පල කරන ලද නිවේදනය ආදේශ කරමි.

ආර්.එම්.එම්.එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල.

09 - 731

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.